# ජීවනෝපාය වත්කම් තීරණය වීම කෙරෙහි භූගෝලීය සාධක වල බලපෑම: කොහොනාවල ග්‍රාමය ඇසුරින්

**කේ.චතුරිකා සහ ටී.එම්.එස්.පී.කේ.තෙන්නකෝන්**
**භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**
sumalichathu@gmail.com
sunethrapk@sjp.ac.lk

මානව ජන ජීවිතයෙහි ඉතා වැදගත් අංගයක් වන ජීවනෝපාය මාර්ග වත්කම් විග්‍රහ කිරීමේදී ඉදිරිපත් කර තිබෙන න්‍යායාත්මක ප්‍රවේශයක් ලෙස ජීවනෝපාය පද්ධතික ප්‍රවේශය ඉතා වැදගත් වේ. ග්‍රාමීය හුදෙකලා ප්‍රදේශයක ජීවනෝපාය වත්කම් තීරණයවීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. අධ්‍යයනය සඳහා කොහොනාවල ග්‍රාමයේ ජීවත්වන 49ක් වූ සමස්ත පවුල් සංඛ්‍යාවම තෝරා ගත් අතර ප්‍රශ්නාවලි සමීක්ෂණය සම්මුඛ සාකච්ඡා නිරීක්ෂණය හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයන යන ක්‍රම දත්ත හා තොරතුරු රැස්කිරීම සඳහා භාවිතයට ගන්නා ලදී. මෙම අධ්‍යයනයේදී සොයාගන්නා පර්යේෂණ ප්‍රතිඵල අතර අධ්‍යයන ප්‍රදේශයේ මානව වත්කම් පහළ මට්ටමක් ගැනීම විශේෂත්වයකි. එහිදී ඉතා අඩු අධ්‍යාපන මට්ටමක් එනම් ප්‍රදේශවාසීන්ගෙන් 18 ක් පාසල් අධ්‍යාපනය නොලැබූ අයවන අතර 47 ක් 5 ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලබා තිබීම දක්නට ලැබුණි. ආර්ථික වත්කම් අතර ප්‍රධාන ආදායම් ලැබීමේ මාර්ගය ලෙස ප්‍රදේශයේ ජීවත්වන්නන්ගෙන් 63 ක් ගොවිතැන් කටයුතුවල නිරත වන අතර අමතර ආදායම් ලෙස 51 ක්ම කුලී කම්කරු සේවයේ නිරතවේ. සමිති සමාගම් වලට යොමු වෙමින් එකිනෙකා අතර මනා බැඳියාව හා සහයෝගයකින් යුක්තව ජීවත්වන නිසා සමාජ වත්කම් ඉහළ මට්ටමක පවතී. මෙම ප්‍රදේශය භූමිය, ජලය, ඉඩම්, වනාන්තර ආදී වූ ස්වාභාවික වත්කම් අතින් අනූන නිසා ආර්ථික වත්කම් ළඟාකර ගැනීමේදී ඒවා භාවිතයට ගැනීම හඳුනාගත හැකිවිය. භෞතික වත්කම් ලෙස ඉතා නොදියුණු මට්ටමක පවතින ගුරුවරුන් 02 ක් සිසුන් 13 ක් හා ගොඩනැගිලි 01 ක් සහිත ප්‍රාථමික පාසල පමණක් දක්නට ලැබුණි. ඉතුරුම්ල ආදායම් හා වියදම් යන මූල්‍ය වත්කම්ද ඇතුළත් සියලුම වත්කම් භූගෝලීය සාධක පදනම් කරගෙන නිර්මාණය වී තිබේ. පංචවිධ වත්කම් තීරණය වීමට හුදෙකලා බව, භූ විෂමතාව, ප්‍රවේශ වීමේ අපහසුව හා ආසන්න නගරයට දුර වැඩි වීම යන භූගෝලීය සාධක හේතුවී තිබේ. පහළ අධ්‍යාපන මට්ටමක් පැවැතීමට, දියුණු සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් ස්ථානගත නොවීමට මෙන්ම වෙනත් භෞතික යටිතල පහසුකම් ඒකාකාරීව පැවතීමට හුදෙකලා බව ඍණාත්මකව බලපා ඇති අතර සමාජ සබඳතා පුළුල් වීමට එය ධනාත්මකව බලපා තිබේ. ප්‍රදේශයේ වගා කරන බෝග වර්ගයන් තීරණය වීමට, ජලවහන පද්ධතිය නිර්මාණය වීමට හා නොදියුණු දුර්වල මාර්ග පද්ධතියක් පැවතීමට උස් කඳුකර භූ විෂමතාව බලපා තිබේ. ප්‍රවේශ වීමේ අපහසුව නිසා නගරයට පැමිණෙන වාර ගණන අඩුවීමත් එනිසාම පාරිභෝගික අවශ්‍යතා හා කාර්යයන් රාශියක් නගරයෙන් එක්වර ඉටුකර ගැනීම, ගම තුළින්ම සීට්ටු දැමීම, අත්තම් ක්‍රම හා ශ්‍රමදාන මගින් කාර්යයන් ඉටුකරගැනීම, සිසු දරුදැරියන් නේවාසිකව සිට පාසල් යාම සහ ගෙවත්තේ ශාක වලින් ලැබෙන එළදාව අපතේ නොයවා කල්තබා ගැනීම වැනි නොනැසී ජීවත් වීමේ උපාය මාර්ග හෙවත් භූගෝලීය අනුවර්තනයන් දක්නට ලැබුණි.

**මුඛ්‍ය පද** - ජීවනෝපාය; වත්කම්; භූගෝලීය සාධක; හුදෙකලාබව; කොහොනාවල